# වැහි ලිහිණී පැටියා



ජානකී සූරියආරච්චි

155

INNER COVER

# වැහි ලිහිණි පැටියා



කතාව චිත්‍ර
පරිගණක අක්ෂර සහ වර්ණ සංයෝජනය

**ජානකී සූරියආරච්චි**

**ටිකිරි ප්‍රකාශකයෝ**

1490/8, හෝකන්දර පාර, පන්නිපිටිය.
Tel: 2847438, E-mail: janu@tikiri.com,
Web: www.tikiri.com

ප්‍රථම මුද්‍රණය - 2009

© ජානකී සූරියආරච්චි

ISBN: 978-955-1090-69-2
**Book Ref: T/09/155**

මුද්‍රණය
තරංජී ප්‍රින්ට්ස්
නො. 506, හයිලෙවල් පාර,
නාවින්න, මහරගම. Tel: 2804773

**ස්තූතිය !**

මගේ පොත්වල අඩු පාඩු නොබැලුවද නිතරම මා ළඟ හිඳිමින් මගේ සියලු දුක සැප බලන මගේ ආදර අම්මාටත්, මා ඉල්ලූ, හැකි සියලු දේ මට ලබාදුන් මගේ ආදර තාත්තාටත්, “හරිම කරදරේ” කියමින් වුවද, මට නිරතුරුවම උදව් කරන (මගේ එකම පොතක්වත් කියවා නැති) මගේ ආදර මල්ලිටත්, මට අකුරු කියාදී මඟ පෙන්වූ මගේ ආදර ආච්චීටත්, මට සෙවනැල්ලක් මෙන් සිටින මගේ ආදර ලොකු අම්මාටත්, මගේ කතන්දර කියවා අඩුපාඩු පෙන්වාදෙන මගේ ආදර මිතුරු මිතුරියන්ටත්, භාෂාවේ මා නොදත් දේ මට හොඳින් කියාදුන් මහාචාර්ය ජේ. බී. දිසානායක මහතාට හා මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මියටත්, කලට වේලාවට මුද්‍රණ කටයුතු නිමකර දුන් පාලිත පෙරේරා මහතාටත්, වචනයකින් හෝ මා දිරිමත් කළ සියලුම දෙනාටත් මාගේ හෘදයංගම ස්තූතිය !

**ජානකී සූරියආරච්චි**
1490/8, හෝකන්දර පාර,
පන්නිපිටිය.
Tel: 2847438
01-08-2009

# වැහිලිහිණි පැටියා



"ක්වීක්, ක්වීක් ! ගැටපිච්චි, ගැටපිච්චි !"
වැහිලිහිණි පැටියා මල් වැට ළඟට ඇවිත් කෑ ගැහුවා.
"කෝ මේ ගැටපිච්චි?"
අම්මයි තාත්තයි එක්ක මුහුදින් එහා දිග ගමනක් ගිහින් ආ
වැහිලිහිණි පැටියා එයාගෙ පුංචි යාළුවාව සෙව්වා.
මුහුදින් එහා ගිය සවාරියේ
කොයිතරම් විස්තර තියෙනවද කියන්න.
"ඒත් ගැටපිච්චි පෙනෙන්න නෑ."
වැහිලිහිණි පැටියා වට පිට බැලුවා.
ම්----හරිම රස්ණෙයි. පළාතම ටිකක් අමුතුයි.
වේලිලා ගිහින් වගේ. තුත්තිරිලා පෙනෙන්නත් නෑ.
තණකොළ බිස්සත් දුඹුරු පාට වෙලා ගිහින්.
"අනේ මගේ ගැටපිච්චිට කරදරයක්වත්ද?"
වැහිලිහිණි පැටියගෙ පපුවත් ගැහුණා.
පුංචි කාලෙ ඉඳන් එකට සෙල්ලම් කළ
හොඳම යාළුවා.
"ගැටපි-ච්-චි--- ක්වීක් ක්වීක් ! කෝ ඔයා?"
වැහිලිහිණි පැටියා පුළුවන් තරම් හයියෙන් කෑ ගැහුවා.
"මිහ් - මිහ් ---" ඒ නම් ගැටපිච්චිගෙ හඬ.
මල් වැට අස්සෙනුයි ඇහුණෙ.
වැහිලිහිණි පැටියා ඉක්මනට
මල් වැට අස්සට එබිලා බැලුවා.



අනේ.... ගැටපිච්චි හොඳටම මැළවිලා, අමාරුවෙන් හුස්ම ගන්නවා.
"අනේ, මේ මොකද වුණේ?" වැහිළිහිණී පැටියා කලබලෙන් ඇහුවා.
"ව-වතුර ටිකක්---" ගැටපිච්චි කෙඳිරි ගෑවා.
"වතුර....? ආ මම ගේන්නම් ! මම රෑං ගාලා ගේන්නම් !"
වැහිළිහිණී පැටියා ඉක්මනට ළිඳ පැත්තට ඉගිලුණා.
"ආ? කෝ මේ ළිඳේ වතුර?"
වැහිළිහිණී පැටියා ළිඳට එබිලා බැලුවා. ළිඳ පතුළටම හිඳිලා.
එයා ඉක්මනට ගඟ පැත්තට ගියා.
"කෝ ගඟ?" ගඟත් හිඳිලා.
යන්තම් පුංචි වතුර බිංදු දෙක තුනක් විතරයි තියෙන්නෙ.
"මේ මොකද වෙලා තියෙන්නෙ?"
වැහිළිහිණී පැටියා පුදුමයෙන් ගඟෙන් ඇහුවා.
"මිහ් ! මිහ් ! මගේ වතුර ටික හිඳිලා ගිහින්."
ගඟ කෙඳිරි ගාමින් කීවා.
"ඒ කොහොමද වතුර ටික හිඳුණේ? මම නොහිටපු ටික කාලෙට
මොකද වුණේ?" වැහිළිහිණී පැටියා කළබලෙන් ඇහුවා.
"ඇයි දැක්කෙ නැද්ද අපේ කන්ද. අලුත් ගෙවල් හදන්න,
කන්දෙ කැලේ තිබුණු ගස් ඔක්කොම කපලා.
ඒ නිසා උල්පත් ඔක්කොම අව්වට වේලිලා. උල්පත් නැති නිසා
මට වතුර නැති වුණා." ගඟ අමාරුවෙන් කීවා.
වැහිළිහිණී පැටියා එතකොටයි දැක්කෙ,
කන්දෙ කැලේ ගස් ඔක්කොම කපලා,
ඉර අව්වට දිලිසෙනවා.

"ඉතින් කන්දෙ කැලේ ගස් කැපුවම කොහොමද
වතුර නැති වෙන්නෙ?" වැහිළිහිණී පැටියා පුදුමයෙන් ඇහුවා.
"ඇයි වැහිළිහිණී පැටියා දන්නෙ නැද්ද එහෙම වෙන හැටි?"
ගං ඉවුරෙ හිටි කොළ හැලිච්ච පෙතං ගහකුත්
කතාවට හවුල් වුණා.
"නෑ මට තේරෙන්නෙ නෑ.
මම නම් දන්නෙ වැස්සක් ආවාම අපට
ගඟ පිරෙන්න වතුර ලැබෙනවා කියලයි."
වැහිළිහිණී පැටියා කීවා.



"වැස්ස ආවාට විතරක් මදි. ඒ වැහි වතුර ටික පරෙස්සම් කරගන්න ගස් තියෙන්න ඕනෙ. නැත්නම් ඒ වැහි වතුර ටිකෙන් කොටසක් වාෂ්ප වෙලාත් අනික් කොටස මුහුදට ගලාගෙන ගියාටත් පස්සෙ ආයෙමත් ඉඩෝරය." ගඟ කීවා.
"ඒ කොහොමද? මට නම් තේරුණේ නෑ." වැහිළිහිණි පැටියා කීවා.

"හොඳයි එහෙම වෙන හැටි මම කියා දෙන්නම්... අහසින් වැටෙන වැස්ස, වනාන්තරේ ගස් උඩට වැටුණාම ඒවා බිමට වැටෙන්නෙ හෙමින්. ඒ නිසා වැසි වතුර පොළොව සෝදාගෙන ඉක්මනට ගලාගෙන යන්නෙ නෑ. වැසි වතුර ගස් හෙවනේ කොළ රොඩු අතර රැඳිලා, හෙමින් හෙමින් පොළොව යටට හොඳට උරාගන්නවා. එහෙම පුළුවන් තරම් වතුර පොළොවට උරාගෙන, වැඩිපුර වතුර තමයි පොළොව දිගේ ගලා ගිහින් ගංගා ඇළ දොළට වැටිලා මුහුදට යන්නෙ." පෙතං ගඟ කියාදුන්නා.

"ඊට පස්සෙ අර පොළොව යටට උරාගෙන
පරිස්සම් කරගත් වතුරට මොකද වෙන්නෙ?"
වැහිළිහිණි පැටියා ඇහුවා.



"වැසි වතුර ටික ගියාට පස්සෙ, ඒ පොළොවෙ පරිස්සම් වුණු වතුර හෙමින් හෙමින් ටිකෙන් ටික උල්පත් දිගේ ගංගා ඇළ දොළවලට ගලා එනවා. එතකොට වැස්ස අඩු කාලෙටත් ගඟට වතුර තියෙනවා. ඉර සැරට පෑව්වත්, ගස්වලට වැහිලා නිසා පොළොව යට තියෙන වතුර ඉක්මනට වාෂ්ප වෙලා යන්නෙ නෑ. ගස් නිසා පොළොවෙ පසත් වතුරත් හොඳට ආරක්ෂා වෙනවා. ඒත් ගස් කැපුවාම වෙන දේ මේ පෙනෙනවා නේද?" ගඟ, කන්ද දිහා බලාගෙන දුකෙන් කීවා.

"ඔව් ඔව්, ගස් නැති වුණාම පරිසරයට
ජල වාෂ්පත් අඩු වෙනවානෙ."
ගඟ අයිනෙ වේලි වේලි හිටි වයසක
ඇටිකුකුල් හාමි කෙනෙකුත්
කතාවට හවුල් වුණා.



"ජල වාෂ්ප? ඒ මොනවද?"
වැහිලිහිණී පැටියාට තවත් ප්‍රශ්නයක්.
"ජල වාෂ්ප කියන්නෙ මුහුදු, ගංගා,
වැව්, පොකුණු, ගස් වැල් වගේ
වතුර තියෙන ඕනෙම තැනකින්,
ඉරේ රස්නෙට වාෂ්ප වෙලා අහසට යන,
ඇහැට නොපෙනෙන තරම් පුංචි වතුර බිංදු."
ඇට්කුකුල් හාමි කීවා.



"ගස් වැල්වලින් වතුර බිංදු? මට නම් තේරෙන්නෙ නෑ. ගංගා, වැව්වල නම් වතුර තියෙනවා තමයි. ඒත් ගස්වල තියෙන්නෙ කොළ නෙ." වැහිලිහිණී පැටියා කීවා.

"ඔයා තවම දන්නෙ නැහැනෙ, මේ සොබා දහමෙ හැටි. ගස් වැල් පොළොව ආරක්ෂා කරනවා වගේම තව ගොඩක් දේ කරනවා. පොළොවෙන් වතුර උරාගෙන, කොළවලින් වතුර බිංදු පිට කරලා පරිසරය සිසිල් කරනවා. ඇයි වැහිලිහිණී පැටියාට දැනිලා නැද්ද, ගස් වැල් ළඟ ඉන්නකොට සිසිලක්. ඒ තමයි ගස්වලින් පිටවෙන ජලවාෂ්ප. ඒ ජල වාෂ්ප සුළඟට එකතු වෙලා අහසටත් යනවා. වැහිලිහිණී පැටියා දන්නවාද අපේ ඇඟෙනුත් ජල වාෂ්ප පිටවෙනවා."



"ඒ කියන්නෙ මගේ ළඟත් සිසිලයිද?"
වැහිලිහිණි පැටියා ඇහුවා.
"නෑ, නෑ, වතුර ගොඩක් තියෙන මුහුදකින්
හැදෙන ජල වාෂ්ප එක්ක බැලුවාම
අපේ ඇඟෙන් පිටවෙන්නෙ හරිම චුට්ටයි.
දැනෙන්නෙවත් නැති තරම්.
ජල වාෂ්ප හැදෙන්නෙ වතුර තියෙන තරමටනෙ."
ඇටිකුකුල් හාමි අත්තටුවලින් හුළං ගහමින් කීවා.



"දැන් ඉතින් ගසුත් නෑ. වතුරත් නෑ. ජලවාෂ්පත් නෑ.
අනේ තවත් මෙහෙම බලාගෙන ඉන්න බැහැ.
මගේ යාළුවා ගැටපිච්චිට වතුර නැතුව හරි අමාරුයි.
මම දැන් මොකද කරන්නෙ?"
වැහිලිහිණි පැටියා දුකෙන් කීවා.
"ඉතින් ඔයාට පුළුවන්නෙ ඈතට ඉගිලිලා ගිහින්
මුහුදෙන් වතුර ටිකක් ඉල්ලගෙන එන්න."
මේ කතා අහගෙන හිටි පුංචි මාදං පඳුරක් කීවා.

"අහ් ! ....ඇත්ත තමයි, මට දැනුයි මතක් වුණේ.
මුහුදෙ තියෙන්නෙ ඕනෙ තරම් වතුර."
වැහිලිහිණි පැටියා එවෙලේම ඉගිලුණා.
ගගයි, පෙතං ගහයි මොනවාදෝ කෑ ගහලා කීවා.
ඒත් වැහිලිහිණි පැටියාට කලබලේට ඇහුණෙ නෑ.
එයා ඉක්මනට ඉගිලිලා ගියා මුහුද දිහාට.



වැහිළිහිණී පැටියා ගල්පරයක් උඩට ගොඩබැහැලා මුහුදට කතා කළා.
"මේ.... අනේ මගේ හොඳම යාළුවා ගැටපිච්චිට වතුර නැතුව හරි අමාරුයි. මට වතුර ටිකක් දෙන්න පුළුවන්ද?"
වැහිළිහිණී පැටියා මුහුදෙන් ඇහුවා.
"හ්ම්---- වතුර නම් ඕනෙ තරම් දෙන්න පුළුවන්. ඒත් වැඩක් නෑ නෙ. ඔයාගෙ යාළුවට මුහුදු වතුර බොන්න බෑ." මුහුද කීවා.
"මුහුදු වතුර බොන්න බෑ? ඒ ඇයි?"
වැහිළිහිණී පැටියා පුදුමයෙන් ඇහුවා.
"මගේ වතුර ගොඩක් ලුණු රසයි. ඒවා ගොඩ පැළෑටිවලට විසයි. ඇයි ඔයාලාගෙ පැත්තෙ ඉඩෝරයක්ද?" මුහුද ඇහුවා.
"අනේ ඔව්. අපේ කන්දෙ කැළේ ගස් ටික ඔක්කොම කපලා, උල්පත් හිඳිලා. පොළොවෙ, ගංගා, පොකුණුවල වතුර ඔක්කොම වාෂ්ප වෙලා ගිහින්. දැන් අපට බොන්නවත් වතුර ටිකක් නෑ."
වැහිළිහිණී පැටියා කීවා.

"වැහිළිහිණී පැටියා දන්නවද මේ පොළොවෙන් 2/3ක් වැහිලා තියෙන්නෙ වතුරෙන්. එයින් 97%ක්ම තියෙන්නෙ මුහුදුවල. ඒ නිසා වැඩිපුරම ජල වාෂ්ප හැදෙන්නෙ මුහුදුවලින්. ඒත් අපේ ළඟ කොයි තරම් වතුර තිබුණත් ඔයාලාට වැඩක් නෑ. බොන්න බෑ නෙ. ඔයාලාට බොන්න පුළුවන් වතුර තියෙන්නෙ 1%යි. ඒ වතුර තියෙන්නෙ ගොඩබිමේ. ඒ ටික පරිස්සම් වෙන්නෙ ගස් නිසා. ඒ නිසා තමයි ගස් අපට මේ තරම් වටින්නෙ. ගස් කැපුවාම ඉර අව්වෙ සැරට පොළොවෙ තියෙන වතුර ටික ඔක්කොම වාෂ්ප වෙලා ගියාම වෙන දේ ඔයා දන්නවනෙ. ආයෙත් කවදා හරි වැස්සක් එනකල් වතුර නෑ."
මුහුද කීවා.







"අනේ මට වැස්සක් හදාගන්න හැටි
කියා දෙන්නකෝ." වැහිලිහිණි පැටියා කීවා.
"වැස්ස හැදෙන්න නම් ජල වාෂ්ප අහසට
ගිහින් සීතල වෙලා වලාකුළු හැදෙන්න ඕනෙ.
ඒ වලාකුළු බරවෙලා වැහි වලාකුළු හැදෙන්න ඕනෙ.
ඒ වැහි වලාකුළුවලට තව තවත් ජල වාෂ්ප
එකතු වෙලා බර වැඩි වුණාම තමයි වැස්ස හැටියට
බිමට කඩා වැටෙන්නෙ. ඉතින් කවදා හරි වැහි වලාකුළක්
වැස්ස අරන් එනකල් බලා ඉන්න තමයි වෙන්නෙ." මුහුද කීවා.

"අනේ මට එතකල් බලා ඉන්න බෑ. මොනවා හරි කරලා මගේ යාළුවා බේරගන්න ඕනෙ. මගේ යාළුවාට හොඳටම අමාරුයි."
වැහිලිහිණි පැටියාගෙ ඇස්වලින් කඳුළුත් ආවා.
වැහිලිහිණි පැටියාගෙ කඳුළු දැකලා මුහුදටත් දුක හිතුණා.
"මම ඔයාට හොඳ අදහසක් කියන්නම්....ඔයා දන්නවනෙ, වැඩියෙන් ජල වාෂ්ප හැදෙන්නෙ වැඩියෙන් වතුර තියෙන තැනින් කියලා. ඉතින් මේ මහ පොළොවෙ වැඩිපුරම වතුර තියෙන්නෙ මුහුදුවලනෙ. ඒ නිසා වැඩිපුර ජල වාෂ්ප පිටවෙලා වැඩිපුර වලාකුළු හැදෙන්නෙත් මුහුදුවලින්....
...දැන් උඩ බලන්න කොයි තරම් වලාකුළු හැදිලා තියෙනවද කියලා. මගෙන් වාෂ්ප වෙලා උඩට යන ජල වාෂ්ප පිරිසිදුයි. ලුණු නෑ. ඔයාට පුළුවන් අහසට ගිහින් ඒ වලාකුළකට කියලා ඔයාලාට වැස්සක් ඉල්ලාගන්න." මුහුද කීවා.





"ආ? ඇත්තටම...? ඒක නම් හොඳ අදහස. එහෙනම් මම දැන්ම යන්නම්!" වැහිළිහිණී පැටියා ඉක්මනට උඩ අහසට ඉගිලුණා.
උඩ අහස හරිම සීතලයි, වෙවුලනවා. වලාකුළු උඩ, හිම පුළුන්කැටි වගේ සුදු පාටයි. හරිම ලස්සනයි... වැහිළිහිණී පැටියා වලාකුළක් ළඟට ගියා.
"අනේ වලාකුළු මාමේ, මගේ හොඳම යාළුවා ගැටපිච්චිට වතුර නැතුව හොඳටම අමාරුයි. මාමාට පුළුවන්ද වැස්සක් වැහැලා වතුර ටිකක් දෙන්න?" වැහිළිහිණී පැටියා සීතලේ ගැහි ගැහී කීවා.
"හොඳයි මම වැස්සක් දෙන්නම්. ඒත් තවම මගේ වලාකුළ වැස්සක් වහින්න තරම් බර මදි. ඉතින් වැහිළිහිණී පැටියාට පුළුවන් තව ටිකක් ජල වාෂ්ප එකතු වෙලා මගේ බර වැඩි වෙනකල්, මාත් එක්ක කතා කර කර ඉන්න. මමත් මේ කතා කරන්න කෙනෙක් නැතුව හරි පාළුවෙන් හිටියෙ." වලාකුළ ඇනුමක් අරිමින් කීවා.
"හා හොඳයි ඉතින් කියන්නකො. මම අහගෙන ඉන්නම්."
වැහිළිහිණී පැටියා කීවා.



"හොඳයි කියන්න බලන්න, වැහිළිහිණී පැටියා දන්නවාද වලාකුළු හැදෙන හැටි?" වලාකුළ ඇහුවා.



"ඔව් මම දන්නවා. මුහුදු, ගංගා, ඇළ දොළ,
ගස් වැල්, පොළොවෙ තියෙන වතුර
ඉරේ රස්නෙට වාෂ්පවෙලා, ඇහැට නොපෙනෙන
ජල වාෂ්ප හැටියට අහසට යනවා.
ඊට පස්සෙ---- අනේ මම දන්නෙ නෑ."
වැහිළිහිණී පැටියා ලැජ්ජා වුණා.



"හරි ඊට පස්සෙ වෙන දේ මම කියන්නම්. ඒ ජල වාෂ්ප අහසට ගියාම, උඩ අහස ගොඩක් සීතල නිසා පුංචි වතුර බිංදු බවට පත්වෙනවා. ඒවා හුඟාක් පුංචියි, සැහැල්ලුයි. ඒ නිසා උඩ අහසෙ පාවෙනවා. මෙහෙම වාෂ්ප වෙලා අහසට එන වතුර, බිංදු බිංදු එකතු වෙලා වලාකුළු හැදෙනවා.....



.....මේ වලාකුළුවලට තව තව ජල වාෂ්ප එකතු වෙලා එකතු වෙලා, බර වැඩි වුණාම වැහි වලාකුළු හැදෙනවා. ඉතින් ඒවාට අහසෙ ඉන්න බැරි තරම් බර වැඩි වුණාම, බිමට කඩා වැටෙනවා. ඒකට තමයි "වැස්ස" කියන්නෙ. සීතල රටවලට හිම, අයිස් හැටියට වහිනවා. අපේ වගේ උණුසුම් රටවලට වතුර හැටියට වහිනවා......"
වලාකුළ කියාදුන්නා.



"එතකොට, වැහි වලාකුළු අඳුරු පාට වෙන්නෙ ඇයි? කිළුටු වෙලාද?" වැහිළිහිණි පැටියා තවත් ප්‍රශ්නයක් ඇහුවා.
"නෑ, නෑ, වලාකුළුවල වතුර බිංදු වැඩි වෙනකොට ඝනකම වැඩි වෙනවා. ඉර අව්වත් වලාකුළෙන් වැහෙනවා. එතකොට පහළ ඉඳන් බලන අයට ඒ වලාකුළු අඳුරු වෙලා පෙනෙනවා. එතකොට තමයි ඔයාලා ඒවාට "වැහි වලාකුළු" කියලා කියන්නෙ. ඒ වගේ වැහි වලාකුළු ගොඩක් අහස උඩට ආවාම ඔයාලා කියනවා, වැහි කළුවරයි, වැස්සක් එන්න වගේ කියලා. එහෙම නේද?" වලාකුළ ඇහුවා.

"ඔව්, ඔව්, මමත් හරි ආසයි වැහි කළුවරේ උඩ අහසෙ කරණම් ගහමින් පියාඹන්න." වැහිලිහිණි පැටියා කීවා... වලාකුළ හිනා වුණා.





"ඉතින් ඊට පස්සෙ ඒ වහින වතුරට මොකද වෙන්නෙ?"
වැහිලිහිණී පැටියා ඇහුවා.
"ඒ වතුරවලින් කොටසක් ආයෙත් පොළොවට උරා ගන්නවා. වැඩිපුර වතුර පොළොව දිගේ ගලාගෙන යනවා. ගංගා ඇළදොළ පිරෙනවා. ඒ ගංගාවල වතුර ආයෙත් මුහුදට යනවා." වලාකුළ කීවා.
"ඊට පස්සෙ ඒ වතුරට මොකද වෙන්නෙ?"
"ඊට පස්සෙ ආයෙත් පොළොව, ගංගා, ඇළ දොළ, මුහුදු, ගස්වැල්වලින් වතුර වාෂ්ප වෙනවා. අහසට යනවා. සීතලට වතුර බිංදු හැදෙනවා. වලාකුළු බර වෙනවා. බිමට කඩාගෙන වැටෙනවා. වැස්ස වහිනවා !"
"ඊට පස්සෙ ඒ වතුරට මොකද වෙන්නෙ?" වැහිලිහිණී පැටියා ඇහුවා.

"ඊට පස්සෙ ආයෙත් ඒ වැහි වතුරවලින් කොටසක් පොළොවට උරා ගන්නවා. වැඩිපුර වතුර පොළොව දිගේ ගලාගෙන යනවා. ගංගා ඇළ දොළ පිරෙනවා. ඒ ගංගාවල වතුර ආයෙත් මුහුදට යනවා. ආයෙත් පොළොව, ගංගා, ඇළ දොළ, මුහුදු, ගස්වැල්වලින් වතුර වාෂ්ප වෙනවා. ආයෙත් ඒකම වෙනවා." වලාකුළ කීවා.
"ඉතින් එකම දේ නේද රවුමට රවුමට වෙන්නෙ?"
වැහිලිහිණී පැටියා ඇහුවා.
"ඔව්, සොබා දහම එහෙම තමයි ඒකට තමයි "ජල චක්‍රය" කියන්නෙ. ජලය වාෂ්ප වෙනවා - වලාකුළු හැදෙනවා - වැස්ස වැටෙනවා - ආයෙත් වාෂ්ප වෙනවා - වලාකුළු හැදෙනවා - වැස්ස වැටෙනවා - ආයෙත්---" වලාකුළ කියාගෙන කියාගෙන ගියා.






ල චක්‍රය

"ඉතින් මේ එකම වතුර ටිකද මෙහෙම කැරකි කැරකි තියෙන්නෙ?"
"ඔව් වැහිළිහිණී පැටියෝ, අවුරුදු බිලියන ගණනකට ඉස්සර පෘථිවිය හැදුණු කාලෙ තිබුණු වතුර ටිකම තමයි කැරකි කැරකි තියෙන්නෙ. ඒ වතුරම තමයි පොළව යටින් ගිහින් උල්පත් හැදිලා ගංගා පොකුණු මුහුදුවලින් වාෂ්ප වෙලා, වලාකුළු හැදිලා, වැස්ස වැහැලා, අලුත් වතුරක් හැටියට ආයෙත් එන්නෙ." වලාකුළ කීවා.

"හරි පුදුමයිනෙ. මම හිතුවෙ හැමදාම ලැබෙන්නෙ අලුතින් හැදෙන අලුත් වතුරක් කියලා. ඉතින් එකම වතුර ආයෙත් ආයෙත් ලැබෙනවා නම් වතුර පරිස්සම් කරගන්න කියලා නිතර කියන්නෙ ඇයි?" වැහිළිහිණී පැටියා පුදුමයෙන් කීවා.
"එහෙම කියන්නෙ හේතු කීපයක් නිසා. පෘථිවියෙන් වැඩි කොටසක වතුර තිබුණත් ඔයාලාට බොන්න පුළුවන් එයින් 1%යිනෙ. ඉතින් ඒ ටිකත් පරිසර දූෂණය නිසා අපිරිසිදු වෙලා ගියොත්, ගස් නැති නිසා පොළොවෙන් ඉක්මනට වාෂ්ප වෙලා ගියොත්, මුහුදට ගලාගෙන ගියොත්, අන්තිමට තියෙන වතුර 1%ත් මදි වෙනවා. ඒ නිසා තමයි වතුර පරිස්සම් කරගන්න කියන්නෙ." වලාකුළ කීවා.

"එතකොට ගස් කැපුවාම කොහොමද වැස්ස නැති වෙන්නෙ? මට නම් තේරෙන්නෙ නෑ." වැහිළිහිණී පැටියා තවත් ප්‍රශ්නයක් ඇහුවා.
"ගස් නැති වුණාම එකපාරට වැස්ස නැති වෙනවා නෙමෙයි. ඒක වෙන්නෙ මෙහෙමයි... ගස් නැති වුණාම ඔයාලාට බොන්න ගොඩබිමේ තියෙන වතුර ටික ඉක්මනට වාෂ්පවෙලා ඉවර වෙනවා. ඔයාම කියන්න බලන්න, දැන් ඔයාලට මොකද වුණේ ගස් කැපූ නිසා?"
"ආ, මම දන්නවා. ඉක්මනට පොළොව වේලිලා
වතුර හිඳිලා ගියා."
වැහිළිහිණී පැටියා කීවා.





"ඔව්, ගස් තිබුණා නම් ලැබෙන වතුර පරිස්සම් කරලා ටික ටික හැමදාම උල්පත්වලට දෙනවා. පරිසරයට ජල වාෂ්ප දීලා පරිසරය සිසිල් කරනවා. ඒවා සුළඟට එකතු වෙලා අහසටත් යනවා. ඇතින් සුළඟට පාවෙලා එන වලාකුළුත් ගස්වැල් තියෙන වනාන්තර උඩින් යනකොට, ඒ ජල වාෂ්පත් එකතු වෙලා වලාකුළු බර වැඩිවෙනවා. එතකොට වැස්ස හැටියට බිමට වැටෙන්න උදව් කරනවා. ඒ නිසා තමයි ලොකු වනාන්තර තියෙන පළාත්වලට නිතර නිතර වහින්නෙ. ඒත් ගස් නැති වුණාම මේ දේවල් ඒ විධියටම වෙන්නෙ නෑ. ඒ මදිවට පරිසර උෂ්ණත්වයත් වැඩි වෙනවා. එතකොට ඔයාලාගෙ පළාත කාන්තාරයක් වගේ වෙලා ඉන්න බැරි වෙනවා." වලාකුළ ආදරයෙන් කියාදුන්නා.

"එතකොට ඈතින් වලාකුළක් පාවෙලා ඇවිත් වැස්සොත්?"
වැහිලිහිණී පැටියා තවත් ප්‍රශ්නයක් ඇහුවා.
"වැස්සක් ආවාට විතරක් වැඩක් නෑ. ඒ වතුර ටික පරිස්සම් කරගන්න ගස් තියෙන්න එපායැ. නැත්නම් ඔක්කොම වතුර ටික ඉක්මනට, වාෂ්පවෙලා ගියාටයි ගංගා දිගේ මුහුදට ගලාගෙන ගියාටයි පස්සෙ, ආයෙත් ඉඩෝරෙ." වලාකුළ කීවා.
"ඉතින් ඒකට කරන්න කිසිම දෙයක් නැද්ද?"

"අපොයි තියෙනවා. ගස් හිටෙව්වොත්, වනාන්තර පරිස්සම් කරගත්තොත් පුළුවන්... අහ් ! මට අමතක වුණා. ගස් නැති වුණාම තවත් කරදර වෙනවා. ගස් නැති පොළොවට වැස්ස වැටෙනකොට වැහි බිංදු කෙළින්ම පසට වැටිලා, අපේ සරු පස සෝදාගෙන යනවා. ගස්, මුල්, කොළ, රොඩු නැති නිසා වෙනදා වගේ පොළොවට උරාගන්නෙ නැතුව, ඉක්මනටම ගලාගෙන ගිහින්, ගංගා ඇළ දොළ පිරෙනවා. ගං වතුර, නාය යෑම් වගේ විපත් වෙන්නත් පුළුවන්....

....ඊට පස්සෙ ඒ වතුර, අපේ පසත් සෝදාගෙන ගංගා ඇළ දොළවලින් මුහුදට යනවා. ඊට පස්සෙ වැස්ස පායලා වතුර බැහැලා ගියාට පස්සෙ ආයෙත් වතුර හිඟවෙනවා. ඇයි පොළොව යටට වතුර උරාගන්නත්, ඒ වතුර පරිස්සම් කරගන්නත් ගස් තිබුණෙ නැහැනෙ." මුහුද කීවා.

"ආ දැන් මට තේරුණා. වතුර පරිස්සම් කරගන්න නම් ගස් හිටවන්න ඕනෙ. ඒ කියන්නෙ අපි ඉක්මනටම කන්දෙ කැලේ ගස් වවන්න ඕනෙ." වැහිලිහිණී පැටියා කීවා.

"ඒ විතරකුත් නෙමෙයි. ගස් නැති වුණාම පරිසර උෂ්ණත්වය වැඩි වෙනවානෙ. එතකොට සීතල ධ්‍රැවවල තියෙන අයිස් කුට්ටි දියවෙලා මුහුදු වතුර මට්ටම ඉහළ යන්න පුළුවන්. මුහුදු කැම් ඇති වෙන්න පුළුවන්. මුහුද ගොඩට ගලලා අපි වගේ පුංචි දූපත් යටවෙන්නත් පුළුවන්." වලාකුළ කීවා.

"අම්මෝ ----- ඔය ඇත්තමද?"

"ඔව්, ඔව්, ගස්වලින් තියෙන ප්‍රයෝජන කියන්න බැරි තරම්. මේ පොළොවෙ ගස් නැති වුණු දවසට අපිත් ඉවරයි. ඒ නිසා තමයි නිතරම කියන්නෙ ගස් කපන්න එපා, වනන්තර පරිස්සම් කරගන්න, අලුතින් ගස් හිටවන්න කියලා." වලාකුළ කීවා.

වැහිලිහිණී පැටියා උඩ බලාගෙන කල්පනා කළා.

"වලාකුළු මාමේ, මට තව ප්‍රශ්නයක් තියෙනවා.

මේ අහස උඩ තියෙන හැම වලාකුළකින්ම වැස්ස ලැබෙනවාද?"



"නෑ, නෑ, හැම වලාකුළෙන්ම වැස්ස ලැබෙන්නෙ නෑ. ඔයා දැකලා ඇති සමහර වෙලාවට අහසෙ ඔහේ පාවෙලා යන වලාකුළු. ඒවායෙන් වැස්ස ලැබෙන්නෙ නෑ. ජල වාෂ්ප ගොඩක් එකතු වෙලා හැදෙන වැහි වලාකුළුවලින් තමයි වැස්ස ලැබෙන්නෙ. තව හේතු ගොඩකුත් තියෙනවා." වලාකුළ කීවා.
"එතකොට මේ මුහුද උඩ තියෙන වලාකුළු ඔක්කොම පාවෙලා ගිහින් අපේ කන්දෙ කැලේ උඩට වැස්සොත්, අපට වතුර ගොඩක් ලැබෙයි නේද?" වැහිළිහිණී පැටියා ඇහුවා.
"අපොයි, අපොයි, මේ ඔක්කොම වැටුණොත් මහා ගංවතුරක් හැදිලා පළාතම යටවෙලා යයි. මුහුදෙ වතුර වාෂ්ප වෙලා හැදෙන වලාකුළුවලින් වැඩි කොටසක් ආපහු වහින්නෙත් මුහුද උඩටමයි. මේවායින් ගොඩබිමට වහින්න නම් සුළං ඇවිත් මේවා තල්ලු කරගෙන යන්න ඕනෙ. ඉතින් ඔය එක එක සුළං කාලෙට මේ වලාකුළු ගොඩාක් තල්ලු වෙලා ගිහින් තමයි ඔයාලාට මහ වැසි වැටෙන්නෙ." වලාකුළ වට පිට බලමින් කිවා.

"එතකොට සුළං හමන්නෙ කොහොමද?"
"සුළං හමන්න හේතු ගොඩක් තියෙනවා. මම දැන් කියා දෙන්නම් නිතරම හමන ගොඩ සුළං, මුහුදු සුළං ගැන. දවල් කාලෙට මුහුදට වඩා ගොඩබිම ගොඩක් රත්වෙනවා. එතකොට රස්නෙ අඩු තැනින් රස්නෙ වැඩි තැනට සුළං හමනවා. ඒ කියන්නෙ මුහුදෙ ඉඳන් ගොඩබිමට සුළං හමනවා. මුහුදෙ ඉඳන් හමන නිසා ඒවාට "මුහුදු සුළං" කියනවා. රෑවෙනකොට මුහුදට වඩා ඉක්මනට ගොඩබිම සිසිල් වෙනවා. ඒ කියන්නෙ රෑට මුහුද ගොඩබිමට වඩා රස්නෙයි. එතකොට ගොඩබිම ඉඳලා මුහුදට සුළං හමනවා. ගොඩබිම ඉඳන් හමන නිසා ඒවාට "ගොඩ සුළං" කියනවා. දවල්ට මුහුදු සුළං, රෑට ගොඩ සුළං. තව එක එක සුළං වර්ග තියෙනවා." වලාකුළ කීවා.



"ඒ කියන්නෙ ඒ සුළංවලට වලාකුළුත් පාවෙනවද?"
වැහිළිහිණි පැටියා ඇහුවා.
"ඔව්, සුළංවලින් වලාකුළු රට ඇතුළට තල්ලු වෙනවා. එතකොට වලාකුළු බරවෙලා තිබුණොත් එවෙලේම වැස්ස ලැබෙනවා. අපේ වගේ මුහුදින් වටවුණු පුංචි රටකට නම්, වැඩිපුරම ජල වාෂ්පත් වලාකුළුත් ලැබෙන්නෙ මුහුදින්. දවල් කාලෙට ගොඩබිම රත්වෙනකොට, මුහුදින් ජල වාෂ්ප අරගෙන එන සුළං, කඳුවැටිවල වැදිලා උඩට යනවා. උඩ අහස සීතල නිසා වලාකුළු හැදෙනවා. නැත්නම් තියෙන වලාකුළුවලට එකතු වෙලා, බර වැඩි වෙලා වැස්ස වැටෙනවා. ඈත සාගරය හරහා එන මෝසම් සුළංවලිනුත් ජල වාෂ්ප වැහි වලාකුළු ගොඩක් එනවා. ඒ විස්තර කීවාට පුංචි පැටියාට තවම තේරෙන්නෙ නෑ." වලාකුළ කීවා.

"වලාකුළු මාමා ඒවා ගැන වෙන දවසක මට කියා දෙන්නකෝ.
දැන් මට ඉක්මනට වැස්සක් තමයි ඕනෙ."
වැහිළිහිණි පැටියා වලාකුළට මතක් කළා.
"ඔහ්- ඔ- ඔන්න කතා කර කර ඉඳලා දැන් මාව බර වැඩි වේගෙනයි එන්නෙ. ඉක්මනට ගිහින් සුළං මාමා එක්ක එන්න. නැත්නම් මාව මෙතනම වැස්ස වෙලා වැටෙයිද දන්නෙ නෑ."
වලාකුළ බර කටහඬකින් කීවා.
"අනේ එපා, එපා, ඉන්න මම ඉක්මනට ගිහින්
සුළං මාමාට එන්න කියන්නම්."
වැහිළිහිණි පැටියා සුළං මාමා සොයාගෙන
රෑං ගාලා පියාඹලා ගියා.







සුළං මාමා ලොකු හදිසියකින් කොහෙදෝ යනවා.
"සුළං මාමේ, සුළං මාමේ, අනේ චුට්ටක් ඉන්නකෝ...."
වැහිළිහිණි පැටියා කෑ ගැහුවා.
"ඇයි පොඩ්ඩො? මම මේ බෙංගාල බොක්ක පැත්තට සැඩ සුළඟක් අරගෙන යන ගමන්." සුළං මාමා කලබලෙන් කීවා.
"අනේ සුළං මාමේ, මට පොඩි උදව්වක් කරන්න පුළුවන්ද? මගේ හොඳම යාළුවා ගැටපිච්චි, වතුර නැතුව ගොඩක් අමාරුවෙන් ඉන්නෙ. මාමාට පුළුවන්ද අර මුහුද උඩ තියෙන ලොකු වලාකුළ අපේ කන්දෙ කැලේ පැත්තට තල්ලු කරලා දෙන්න? එතකොට කන්දෙ කැලේට වැස්ස වහියි." වැහිළිහිණි පැටියා කීවා.

"ම්---- මම මේ ලොකු ගමනක් යන ගමන්."
සුළං මාමා ටිකක් කල්පනා කළා.
"ඒත් කමක් නෑ, ඔයා හරි හොඳ යාළුවෙක් වගේ. ඒ නිසා මම ඔයාට ඒ වලාකුළු ටිකක් තල්ලු කරලා දෙන්නම්කො."
සුළං මාමා ඉක්මනට කැරකිලා උඩට ආවා. මුහුද උඩ අහසෙ තිබුණු වලාකුළුවලින් ටිකක් එක හුස්මට තල්ලු කරගෙන ආවා, රට ඇතුළට. දැන් නම් වලාකුළු පිරිලා කඩා වැටෙන්න ඔන්න මෙන්න වගේ. වලාකුළුවලින් ඉර මාමා වැහිලා, කන්දෙ කැලේ කළුවර වුණා. සුළං මාමා හයියෙන් ආවා. හෝ - හෝ - හෝ ගාලා සුළං හැමුවා.





"අන්න අන්න වැහි වලාකුළු! වැස්සක් එනවා,
වැස්සක් එනවා."
පුංචි ළමයි කෑ ගහමින් මිදුලට පැන්නා.
අම්මලාත් වැලේ තිබුණු රෙදි අරගෙන ගෙට දිව්වා.
කුරුල්ලො, සත්තු සතුටින් උඩ පැන්නා.
හරියටම කන්දෙ කැලේ කිට්ටුවට එනකොට
වලාකුළු ටික එක පාරටම කඩා වැටුණා.

"මහ වැස්සක් ! මහ වැස්සක් !" හැමෝම සතුටින් කෑ ගැහුවා.
වේලිලා ගිහින් තිබුණු පොළොව පුළුවන් තරම් වතුර උරාගත්තා.
වැඩිපුර වතුර පොළොව දිගේ ගලාගෙන ගියා.
ගංගා ඇළ දොළ පිරුණා.
මැළවිලා ඉතිරි වෙලා තිබුණු ගස් වැල් ටිකට පණ ආවා.
"ඉක්මනට ආයෙත් කන්දෙ කැලේ ගස් හිටවන්න ඕනෙ."
පුංචි ළමයි කතා වුණා.







වැහිළිහිණි පැටියා ඉක්මනට ගියා ගැටපිච්චි බලන්න,
මල් වැට ළඟට. ගැටපිච්චිට සතුට ඉවසගන්න බෑ.
එයා මූණ අහසට හරවාගෙන වැහි වතුර නානවා.
වැහිළිහිණි පැටියට හරි හිනා.
වැස්ස ලැබුණු හැටි තවම ගැටපිච්චි දන්නෙ නැහැනෙ.
"එන්න, එන්න, මං මෙහේ----!"
ගැටපිච්චි මල් වැට යටින් එබිලා කෑ ගැහුවා.
වැස්ස ඇවිත් ගැටපිච්චිට තියෙන සතුට!
ගැටපිච්චි වෙනදාටත් වඩා ලස්සනට හිනා වුණා.
වැහිළිහිණි පැටියාට හරිම සතුටුයි.

එයාත් ඉක්මනට මල් වැට යටට රිංගා ගත්තා.
"ඉතින් ඔන්න අහගන්න මගේ අලුත්ම කතන්දරේ."
වැහිළිහිණි පැටියා දිග කතාවකට හරි බරි ගැහුණා.
දැන් එයාට මුහුදින් එහා ගිය සවාරියටත් වඩා
ලස්සන කතන්දරයක් තියෙනවානෙ කියන්න....
... "වැස්ස" ගැන.

